# කාත්තන්කුඩි නගර සභාව
## මඩකලපුව දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව කාත්තන්කුඩි නගර සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කාත්තන්කුඩි නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් ඉක්ම වූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.6,857,006 ක් විය.

#### 1.3.2 අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රෙගුලාසි හා චක්‍රලේඛ වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1992 සැප්තැම්බර් 30 දිනැති 1769 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට රු.148,227 ක් වූ සැලසුම් ඇදීම් ගාස්තු ගෙවා තිබුණි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අංක 3.9.1 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනිව වටිනාකම රු.5,400,000 ක් වූ ප්‍රජා මධ්‍යස්ථාන 3 ක සිවිල් වැඩ ප්‍රදානය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය | ගෙවීම් වලින් 5 % ක් වු රදවා ගැනීම් බදු රු.2,735 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 685 | ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව කොන්ක්‍රීට් කණු හා බැරල මිලදී ගැනීම සදහා රු.19,450 ක් වැය කර තිබුණි. |
| (ඉ) | මුදල් රෙගුලාසි 138 | වගකිව යුතු නිලධාරියකු සහතික කිරීමෙන් තොරව අතිකාල සදහා රු.14,334 ක මුදලක් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.2,415,911 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවු පුනරාවර්තන වියදම රු.349,106 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම**

සභාපති විසින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 7,719 | 13,696 | 6,076 | 4,485 | 5,954 | 5,976 |
| (ii) | බදු කුලී | 2,034 | 2,046 | 282 | 1,073 | 1,073 | -- |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,118 | 3,122 | - | 1,649 | 1,716 | 12 |
| (iv) | වෙනත් ආදායම | 3,502 | 3,502 | 43 | 4,423 | 4,423 | 04 |

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත වියදම , තථ්‍ය වියදම හා විචලනය පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **පුනරාවර්තන වියදම** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 27,244 | 28,536 | (1,292) | 21,067 | 25,687 | (4,620) |
| වෙනත් | 5,552 | 5,802 | (250) | 5,954 | 3,752 | 2,202 |
| උප එකතුව | 32,796 | 34,338 | (1,542) | 27,021 | 29,439 | (2,418) |
| මූලධන වියදම | 7,620 | 4,460 | 3,160 | 40,825 | 5,375 | 35,450 |
| මුළු එකතුව | 40,416 | 38,798 | 1,618 | 67,846 | 34,814 | 33,032 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | 2010 දෙසැම්බර් 31 දිනට අනුමත | 2010 දෙසැම්බර් 31 දිනට තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | 01 |
| ද්විතීය ශ්‍රේණිය | 19 | 18 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 64 | 62 |
| වෙනත් ( අනියම් / තාවකාලික ) | -- | 40 |
| | 84 | 121 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු.2,811,060 ක් විය.

### 2.5.2 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

රු.195,000 ක් වටිනාකම වූ මෝටර් වාහන, වර්ෂ 4 කට වැඩි කාලයක් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**2.6 අයවිය යුතු සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවූ අයවිය යුතු සේවක ණය ශේෂ රු.42,110 ක් විය.

**2.7 සමීක්ෂණය නොකළ වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු කර නොගෙන පොත්වල දැක්වෙන ශේෂය මත ගණනය කරන ලද වත්කම්වල වටිනාකම රු.17,935,753 ක් විය.

**2.8 අභ්‍යන්තර විගණනය**

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) ආදායම් පරිපාලනය